**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් 05 අනුව ගිණුම්ගත කරන ලද මාන්කඩවල කොක්කිච්චිය මාර්ගයට කුට්ටිගල් ඇතිරීමේ ව්‍යාපෘතිය වියදම් රු.283,490 ක් ඉවත් කිරීමේදී 2021 වර්ෂයට අදාල ක්ෂය රු.28,349 ක් වුවත් එය රු.255,141 ක් ලෙස වැඩියෙන් සමුච්චිත අරමුදල බැරකර තිබුණි. | පිළිගනිමි | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ඉදිකරන (LDSP ව්‍යාපෘතිය) පණ්ඩුලගම පෙර පාසලේ ගොඩනැගිල්ල වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.7,844,234 ක් අත්තිකාරම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සේවක වැටුප් දීමනා ප්‍රතිපූර්ණය රු.25,525,586 තුළ ඇතුළත් රු.5,160,000 ක් වූ සභික දීමනා ප්‍රතිපූර්ණය වීම් වෙනම හෙළිදරව් කර නොතිබුණි. | -එම- | සේවක දීමනා ප්‍රතිපූරණය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනම හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ බොරළු මාර්ග ඉදිකිරීම්වලට ඇතුළත් රු.390,208 ක් වූ බෝක්කු 02 ක් ඉදිකිරීම් පුනරාවර්තන වියදම් ප්‍රදාන යටතේ ගිණුම්ගත කර තිබුණි. | -එම- | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.223,060 ක තොගයක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ඉතිරි තොග නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී අතිරික්තයේ/ඌණතාවයේ හඳුනාගත් රු.3,213,899 ක ප්‍රාග්ධන වියදම් දීමනා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එකතු කර දක්වා තිබුණි. | -එම- | මුදල් ගලා ඒම් නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (උ) | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබුණු රු.14,000,000 ක් වූ ජල බවුසරයේ වටිනාකම මුදල් ප්‍රවාහයේ මුදල් ලැබීමක් ලෙස දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විස්තීරණ ආදායම් ප්‍රකාශය අනුව ආදායම් අයිතමයක හා වියදම් අයිතමයක වටිනාකම හා මූලික පොත් අනුව වටිනාකම අතර රු.180,570 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 01 දිනට අතිරික්තයේ/ඌණතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය රු.43,706,376 ක් වුවත් ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය අනුව එය රු.15,349,689 ක් වූයෙන් රු28,356,687 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඇ) | 2022 ජනවාරි 01 දිනට සමුච්චිත අතිරික්තය (ඌණතාවය) රු.213,987,018 ක් වුවත් ශුද්ධ වත්කම්/ස්කන්ධව වෙනස්වීමේ ප්‍රකාශය අනුව එය රු.241,979,601 ක් වූයෙන් රු.27,992,583 ක වෙනසක් විය. | -එම- | -එම- |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු. 133,706,251 ක් වූ ස්ථාවර වත්කම් හා ජංගම වත්කම් සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවිම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | පිළිගන්නා බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂය සඳහා ගැලපීම් ලෙස දක්වා ඇති රු.1,254,702 ක වටිනාකම කුමක්ද යන්න තහවුරු කරන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීණි. | -එම- | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.5,616,894 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.13,086,813 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,249,224 | 2,401,534 | 1,790,450 | 715,084 | 2,918,210 | 2,208,179 | 2,189,979 | 104,000 |
| (ii) | කුලී | 7,550,236 | 6,476,026 | 6,385,414 | 1,557,809 | 6,677,434 | 5,952,398 | 6,755,873 | 1,461,207 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,156,600 | 6,144,636 | 5,912,336 | 2,045,550 | 4,854,050 | 6,840,705 | 5,027,455 | 1,813,250 |
| (iv) | වෙනත් ආදායම් | 30,974,200 | 17,284,759 | 11,186,184 | 25,943,938 | 26,449,000 | 13,334,075 | 9,523,513 | 19,845,363 |
| | | 46,930,260 | 32,306,955 | 25,274,384 | 30,262,381 | 40,898,694 | 28,335,357 | 23,496,820 | 23,223,820 |

=

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන 2021 අගෝස්තු 27 දින අංක 2243 ගැසට් පත්‍රයේ පළකර තිබුණු නමුත් වරිපනම් අයකිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | දේපළ සමීක්ෂණ කටයුතු ලිපිය 2023 අප්‍රේල් 21 දින යවා ඇති බව. | ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.1,868,650 ක හිඟ කසළ බදු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | මේ වනවිට හිඟ බදුකරුවන් 232 ක් හඳුනාගෙන ඇති අතර හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ව්‍යාපාර බදු රු.234,300 ක් කර්මාන්ත බදු රු.20,000 ක් හා ආදායම් මත බදු රු.172,584 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර බදු 16,650 ක්ද කර්මාන්ත බදු රු.7,000 ක්ද සහ ආදායම් බදු රු.172,584 ක්ද අයකරගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන ඇති බව. | -එම- |
| **(ආ)** | **කුලී** | | |
| | මස්කඩ, මාළු ලැලි, සතිපොල හා ටෙන්ඩර් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,518,805 ක හිඟ කුලී අය කර ගෙන නොතිබුණි. | මාළු ලැලි සඳහා රු.36,000 ක් අයකර ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති බව. | ඉතිරි හිඟ මුදල ද අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.7,991,379 ක් හා මුද්දර ගාස්තු රු.17,927,705 ක් ගෙන්වාගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1.1 ගව සතකාගාර පවත්වාගෙනයාම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ පිහිටි මස්හල් සඳහා ඝාතනය කරන සතුන් වෙනුවෙන් 1988 අගෝස්තු 23 දිනැති පොදු සම්මත අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාව 09 වගන්තිය ප්‍රකාරව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් පරීක්ෂා කර සලකුණු කරන සෑම මස් කිලෝ 01 ක් සඳහාම රු.10 නොවැඩි ගාස්තු 2022 වර්ෂයේදී අය කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අළුත්ගම ගව මස් වෙළඳසැල සඳහා 2020 මැයි 11 දින ලදුපත් අංක 679 අනුව ලැබී තිබුණු රු.50,000 ක ආපසු ගෙවන ඇප තැන්පතු මුදල 2021 වර්ෂයේ ලැබිය යුතු බදුකුලී වලට අදාල ලදුපතේ ඡායා පිටපත අනුව හිලව් කර තිබුණු අතර 2022 වර්ෂයේ ලැබිය යුතු කුලීවලට එම ලදුපතෙහි මුල් පිටපත ඉදිරිපත් කර එකම තැන්පත් මුදල අවස්ථා 02 කදී හිලව් කර තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ බව. | අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කරගෙන විගණනය සඳහා වාර්තා කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ තැන්පත් ශේෂය තුල වසර 01 ක් 04 ක් අතර කාලයක සිට රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය නොකළ රු.1,674,872 ක ශේෂයක්ද මාස 06 ක් ඉක්ම වූ රු.289,054 ක් වූ චෙක්පත් 16 ක්ද 2019 වර්ෂයේ වැන්දඹු අනත්දරු අරමුදලට ප්‍රේෂණය නොකළ රු.17,958 ක්ද හා පළාත් පාලන | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට රු.448,396 ක් ප්‍රේෂණය කර ඇත. ඉතිරි රු.1,226,475 ක් කඩිනමින් යැවීමට කටයුතු කරමි. රු.89,054 ක චෙක්පත් 15 ක් පමණක් නැවත ගෙවීමට හෝ ආදායමට ගැනීමට | හිඟ වාරික කඩිනමින් ප්‍රේෂණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු රු.9,589 ක්ද නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | කටයුතු කරන අතර ඉතිරි මුදල් ගෙවා ඇත. | |

**3.4 වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.700,000 ක ප්‍රතිපාදන වලින් 2019 වර්ෂයේදී ලෝලුගස්වැව කසළ අංගනයේ ඉදිකරන ලද නල ළිඳ, අක්‍රීයව වසර 02 කට අධික කාලයක් ගතවී ඇතත් එය නිවැරදි කර නොතිබීම නිසා කසළ අංගනය සඳහා අවශ්‍ය ජලය අමතර පිරිවැයක් දරමින් පිටතින් ලබාගැනීම සිදුකරමින් පැවතුණි. | පොම්පය අළුත්වැඩියා කිරීමට යැවූ බව. | නල ළිඳ කඩිනමින් අළුත්වැඩියා කර ගැනීමට ක්‍රියාකළ යුතුය. |